ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2019 සැප්තැම්බර් 26 |

## බලපත්‍රලාභී බැංකු වල රුපියල් තැන්පතු සඳහා බලපාන උපරිම පොලී අනුපාත පිළිබඳ මුදල් නීති පනත් නියෝගය අවලංගු කිරීම

මෑතකාලීනව ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ වල බලපෑම , වෙළඳපොළ ණය පොලී අනුපාත වෙත කාර්යක්ෂමව සම්ප්‍රේෂණයවීම වර්ධනය කිරීම සඳහා, රුපියල් ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාත පහත දමන ලෙස දැනුම් දෙමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කල විධානයට සමගාමීව, 2019 අප්‍රේල් 26 වන දින නිකුත් කරන ලද ශ්‍රී ලංකා රුපියල් තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත පිළිබඳ 2019 අංක 01 දරන මුදල් නීති පනත් නියෝගය, 2019 සැප්තැම්බර් 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කිරීමට මුදල් මණ්ඩලය තීරණය කර ඇත.